# 71

# කාව්‍යය හා සදාචාරය

*මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ*

කාව්‍යයත් සදාචාරයත් අතර සබඳතාවක් තිබේ ද? මේ පිළිබඳ ව පැරැන්නෝ කුමක් කීවාහු ද? මෙකී ප්‍රශ්න ගවේෂණය කිරීම මේ ලිපියේ අරමුණ වන්නේය. ඒ අතර ම මේ ගැන අපගේ නිගමන ද මෙහි ඉදිරිපත් කෙරෙයි.

කාව්‍යයේ සදාචාරාත්මක අගය පිළිබඳ පැරැණි භාරතීය ආකල්පය පුරුෂාර්ථ හෙවත් ජීවිතයේ පරමාර්ථ පිළිබඳ සංකල්පය හා ඈඳුණකි. පුරාණයන්ට අනුව මිනිස් ජීවතයේ පරමාර්ථ සතරක් වෙයි;

1. ධර්ම (දහැමි බව)
2. අර්ථ (ද්‍රව්‍යමය වත්කම්)
3. කාම (සැප විඳීම)
4. මෝක්ෂ (ලෝකෝත්තර විමුක්තිය)

මිනිසෙකු වරෙක මින් එක් පුරුෂාර්ථයකට බර විය හැකි ය. තවත් වරෙක තවත් පුරුෂාර්ථයකට බර විය හැකිය. එසේ වුවත් ඇතැම් පුරුෂාර්ථ සම්පූර්ණයෙන් ම නොසලකා හළ හොත් ඔහු ද අවදානමට මුහුණපායි. මෙකී පුරුෂාර්ථ අන්‍යෝන්‍ය වශයෙන් එකට බැඳී ඇත. මින් එක් පුරුෂාර්ථයක් අනික් පුරුෂාර්ථවලින් ස්වාධීන ව වෙන් කර ගෙන සාක්ෂාත් කරගත නොහැකි ය.

භාරතීය සෞන්දර්යය විද්‍යාව කාව්‍යය හා සදාචාරය යන දෙක එකිනෙකට ප්‍රතිපක්ෂ කරුණු ලෙස නො සලකයි. ඊට හේතුව කාව්‍යයෙහි නිරූපණය කෙරෙන ස්ථායි භාව (මනෝ භාව) පුරුෂාර්ථ සතර සමඟ අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පැවතීමයි. කාව්‍යය මගින් ධර්ම (දැහැමි බව), ක්‍රීඩා (කෙළි සෙල්ලම්), අර්ථ (ද්‍රව්‍යමය වත්කම්) සහ සම (සන්සුන්කම) යන කරුණු නිරූපණය කෙරෙතැ යි කියමින් භරතමුනි මේ අන්‍යෝන්‍ය සම්බන්ධය මැනවින් පැහැදිලි කළේය.[1] ස්ථායිභාව සහ පුරුෂාර්ථ අතර ඇති මේ අවියෝජනීය සම්බන්ධය අභිනවගුප්තයෝ ද සනාථ කරති.[2] අභිනවගුප්තයන් පිළිගන්නේ කාව්‍යයේ රස නවයක් පමණි.[3] ඊට හේතුව ඔවුන්ගේ පිළිගැනීම අනුව පුරුෂාර්ථ සමඟ වෙන් නොකළ හැකි පරිදි බැඳී පවත්නේ ඒ නවයට පාදක වන මනෝභාව පමණක් ම වීමයි.[4]



ජීවිතයේ මෙකී පරමාර්ථ (අන්ත) සතර සාක්ෂාත් කරගැනීමෙහි ලා මිනිසාට උපකාරි වන මාර්ග පිළිබඳ ව ඔහු දැනුවත් කරනුයේ කාව්‍යයයි. කාව්‍යය ඔහු ධර්මය දෙසට යොමු කරයි. අධර්මයෙන් බැහැර කරයි. මෙකී 'ධර්ම' යන්න ආගමික හෝ සාමාජික වශයෙන් පිළිගැනෙන දැඩි විනය නීති යැයි වරදවා වටහා නොගත යුතුය. ධර්ම යන පදය සෑදී ඇත්තේ 'දැරීම', 'ප්‍රතිෂ්ඨා වීම' යන තේරුම් ගෙන දෙන 'ධා' යන ධාතුවෙනි.

එ බැවින් ධර්ම යනු ජීවිතය දරා සිටින, ඊට ආධාර වන හා එය උසුලා සිටින දෙයයි. එය ජීවිතයට අත්‍යවශ්‍ය වන නීතියයි; පුද්ගල චර්යාවෙහි හරය හා සම්බන්ධ වන නීතියයි. එ පමණක් නොව එය සදාචාරය ද වෙයි. එය ආචාර ධර්ම ඉගැන්වීමට ලියැවුණු අත්පොත්වල එන සදාචාරය නො වේ. එය වනාහි පුද්ගලයෙකුගේ පෞරුෂයේ සාරභූත නීතිය සමඟ සම්බන්ධ වන සදාචාරයයි. කාව්‍යයට පැවරී ඇති ශ්‍රේෂ්ඨතම කාර්යභාරය වනුයේ සියලු සදාචාර ධර්මයන් විනිශ්චය කරන මේ 'ධර්ම' පිළිබඳ ව අප දැනුවත් කිරීමයි. මේ අරුතින් කාව්‍යය වේද සම්මත හෙවත් වේදයට සමානය. වේද යනු පැරණි ඉන්දියාවේ ශුද්ධ වූ ග්‍රන්ථ සතරයි. එහෙත් කාව්‍යයට වේදය ද ඉක්මවා යන වාසියක් ඇත. එනම්, එය අප සුබාස්වාදයෙන් කුල්මත් කිරීමයි. නාට්‍යය ක්‍රීඩා අවේගය තෘප්ත කරන, සන්තෝෂය ඇති කරවන කලාවක් බව පවසන භරතගේ ප්‍රකාශය ගැන සඳහන් කරන අභිනවගුප්තයෝ නාට්‍යය සීනි ආලේප කළ තිත්ත ඔසුවක් ලෙස නිර්වචනය කරති.[5] ඔවුන් මින් අදහස් කරන්නේ පද්‍යයක ගැබ් වන සදාචාර අංශය ස්වභාවයෙන් ම අමිහිරි බවත්, රස යනු එය ගිලීමට පාඨකයා පෙලඹවීම් වස් එහි මතුපිටින් තැවරූ ගුණයක් බවත් නො වේ. කාව්‍යයේ ගැබ් වන සදාචාරාත්මක අගය තමා කාව්‍යයේ ගැබ් වන බව පාඨකයාට පෙන්වා දීමට වෑයම් කරන්නේ, ක්‍රියාත්මක වන්නේ මුදුමොළොක් විලාසයෙනි. කාව්‍යයේ ගැබ් වන සදාචාර පැතිකඩ ක්‍රියාත්මක වන්නේ රසිකයාට නොදැනෙන අන්දමට මෙන් ම මධුර වූ ද ආකාරයකිනි.

කාව්‍යය අපට යමක් උගන්වනවාක් මෙන් ම අප සිත තුළ චමත්කාරය ද ජනිත කරයි යන පුරාණ රෝමයේ විසූ සාහිත්‍ය න්‍යායාචාර්ය හොරස්ගේ මතය ප්‍රීති (චමත්කාරය) සහ ව්‍යුත්පත්ති (ශික්ෂණය) ද අපට ලබා දෙයි යන ඉන්දීය අදහසට සමාන අරුත් ගනියි. අප තුළ සුබ ප්‍රහර්ෂය ඇති කිරීම සෞන්දර්යානුභූතියේ ස්වභාවයයි. එමෙන් ම එයට භාර කටයුත්ත වනුයේ අපට ශික්ෂණකාරී උපදෙස් දීම ද වන්නේය. එහෙත් කාව්‍යය අපට ලබාදෙන මෙකී ව්‍යුත්පත්තිය අප විද්‍යාවෙන් හෝ ආගමික ග්‍රන්ථවලින් ලබන දැනුමට හා උපදෙස් සමඟ අනන්‍ය නොකළ යුතුය. කාව්‍යයෙන් අප ලබන

ව්‍යුත්පත්තියෙන් අපගේ පරිකල්පන ශක්තිය පුළුල් වෙයි.[6] මෙහි තේරුම නම් කාව්‍ය පරිශීලනය නිසා අපට වඩවඩාත් කාව්‍යයේ රසය විඳීමට ඉන් හැකියාව ලැබෙති'යි යන්න නො වේ. ජීවිතයේ සාරධර්මවල පදනම පිළිබඳ අප වඩාත් හොඳින් දැනුවත් කිරීමක් කාව්‍යයෙන් සිදු වන හෙයින් අපගේ පරිල්පන ශක්තිය පුළුල් වීමට හා ප්‍රබල වීමට ද එය හේතු වෙයි. කාව්‍යයට ප්‍රතිචාර දක්වන විට පමණක් නොව ජීවිතයේ විවිධ අවස්ථාවලට මුහුණ දෙන විට ද අපගේ පරිකල්පන ශක්තිය (නිර්මාණ ශක්තිය) මෙහෙයවීමට අපට සිදු වෙයි. කාව්‍යයෙන් ලබන චමත්කාරය සදාචාරධර්ම සාක්ෂාත් කිරීමට උපකාරි වන මඟක් නො වේ. කවියා පාඨකයාට චමත්කාරය නමැති අල්ලස පිරිනැමීමේ දී ඔහු තුළ ප්‍රකට ව පෙනෙන අරමුණු කිසිවක් නැත. කාව්‍යය පරමාර්ථ හා මාර්ග අතර පවත්නා ගැටුම් දිය කර හරී. ප්‍රීති (ආහ්ලාදය) සහ ව්‍යුත්පත්ති (ශික්ෂණය) යන දෙක එකිනෙකින් වෙනස් නොවෙතැයි ද ඒවා එක ම දෙයක පැති දෙකකැයි ද අභිනවගුප්තයෝ කියති.[7]

වෙලෙක් සහ වොරන් ද මේ නිගමනය කරා ම එළඹෙති: "සාහිත්‍ය කෘතියක් සාර්ථකත්වයේ හිණිපෙත්ත කරා ළඟා වූ විට සුඛාස්වාදය සහ උපයෝගිතාව යන ලක්ෂණ දෙක හුදෙක් එකට පැවතීම පමණක් නො සෑහේ; ඒවා අභේද්‍ය ලෙස ඒකාබද්ධ විය යුතුය."[8]

## සදචාරකාරී පරිකල්පනය

ෂෙලීගේ කාව්‍යය ආරක්ෂා කිරීම (Defence of poetry) නමැති කෘතිය සහේතුක මතයක් පිළිබිඹු කරන්නකට වඩා ආවේශිත කාව්‍ය ගුණ ගීතයකි. එහෙත් එහි කාව්‍යයේ සදචාර අගය අරබයා සිත් ගන්නාසුලු අදහස් කීපයක් දක්නට ලැබේ. මේ රචනාව ආරම්භයේ දී ඔහු 'කවියා' යන පදය භාවිත කරනුයේ දර්ශනිකයන් හා දේශපාලන විශාරදයන් ද ඊට හසු වන අන්දමේ පුළුල් අරුතක් ඊට දෙනු පිණිසය.[9] කාව්‍යය යනු පරිකල්පන ශක්තියේ ප්‍රකාශනයයි.[10] පරිකල්පන ශක්තිය යනු සුසංවාදයෙන් හා අවිරෝධයෙන් යුතු පටිපාටිගත පරමාදර්ශී ලෝකයට පිවිසීමට මිනිසා මෙහෙයවන මිනිසා තුළ වන බුද්ධි අංශයයි. එසේ වුවත් පසු ව "භාෂාවේ ඇති, විශේෂයෙන් ම ඡන්දස් යොද හසුරුවන භාෂාවේ ඇති එකී විශේෂ පද සංවිධානයට" පමණක් ශෙලී කාව්‍යය යන්නෙහි තේරුම සීමා කරයි. ඡන්දස් සහිත මේ භාෂාව මිනිසා නිර්මාණය කරනුයේ එකී තේජස්වී මහිමය මගිනි. ඒ මහිමය ලැගුම් ගත් වමානය මිනිසාගේ අදෘශ්‍යමාන ස්වභාවය නමැති තිර පටින් ආවරණය වී ඇත."[11]

කාව්‍යයට අතිශයෝක්ති හරිත උදර උරුමකම් හිමි වන බව කියැවෙන ඒ ඡේදය ගැන බොහෝ දෙනා දනිති. "කවීන් වනාහි



ලෝකයේ නොපිළිගත් නීති සම්පාදකයින්" ලෙස ඔහු හඳුන්වයි.[12] එහෙත් "කවියා යනු අඳුරේ ලැගුම් ගෙන කන්කලු හඬින් ගී ගයමින් තම හුදෙකලාව ගැන ම උදන් අනන කොවුලෙකැයි" ඔහු ම වෙනත් තැනක කරන සඳහනට මෙය පටහැනි වෙයි.[13]

ඇතැම් විට මෙවැනි අදහසක් ප්‍රකාශ කිරීමට හේතු වන්නට ඇත්තේ ස්වර්ණමය චින්තන රජ දහනින් දූත මෙහෙවරක් උදෙසා මෙහි පැමිණි මේ මධුරතර දූතයා කෙරෙහි ශෙලීගේ පරපුර අනුගමනය කළ උදසීන ප්‍රතිපත්තිය හා ඇතැම් විට ඔහුට පටහැනි වීම නිසා තමාගේ සිත තුළ හටගත් දෙම්නස විය හැකියි.

ශෙලීගේ ප්‍රකාශනයෙහි එක්තරා අන්දමකින් තිලිප් සිඩ්නිගේ අදහස්වල දෝංකාරයන් ගැබවන බව අපට පෙනේ. මේ දෝංකාරයෙන් ඔහුගේ රචනාවෙහි ගැබ් වන ප්‍රධාන අදහසට ප්‍රතිවිරෝධී වන බව ද පෙනෙයි. සිඩ්නි කාව්‍යය සදචාරාත්මක වශයෙන් වටිනා දෙයක් වනුයේ එමගින් උත්කෘෂ්ට චරිත ආදර්ශ කර දක්වන බැවිනැයි තර්ක කළේය. පාඨකයා විසින් සුචරිතය පිළිබිඹු කරන මේ ශ්‍රේෂ්ඨ චරිත සැබැවින් ම සැලකිය යුත්තේ යහපත් චරිත හා ගතිගුණ මේ යැයි පෙන්වන ආදර්ශ ලෙසිනි.

ශෙලී ද මීට ම සමාන ව තර්ක කරයි. හෝමර් තමා විසූ යුගයට හිම පරමාදර්ශී ශ්‍රේෂ්ඨ පරිසමාප්ත බව තමා නිර්මාණය කළ චරිත තළට පිවිසවීය. ඇචිලීස්, හෙක්ටර්, යුලිසිස් සහ වෙනත් අය ගැන කියවන විට අපි ඔවුන් අගය කරමු; ඔවුන් මෙන් යහපත් වීමටත් වීරයන් වීමටත් අධිෂ්ඨාන ද කරගනිමු.[14] කාව්‍යය සුචරිතයට කරන බලපෑම පිළිබඳ ව මෙය ඉතා රළු දෘෂ්ටියකි. ශෙලී ම පවා වෙනත් තැන්වල එවැනි දෘෂ්ටියක් බැහැර කළේය. Prometheus Unbound (බන්ධන මුක්ත ප්‍රොමිතියස්) නම් කෘතියේ පෙරවදනෙහි ඔහු මෙසේ ප්‍රකාශ කරයි:

"උපදේශ කාව්‍යය මට රුචි නොවේ." ඔහු තම tio හි මිල්ටන් කවියා මවන දෙවියන් වහන්සේ සාතන් ඉක්ම වූ ගුණයහපත්කමින් යුක්ත නො වන සේකැයි මෙසේ කාව්‍යයේ ඍජු හා රළු උපදේශ දීමේ අවශ්‍යතාවක් නො දැකීම මිල්ටන්ගේ සුධීමත්භාවය පෙන්වන තීරණාත්මක සාධකයකැයි ද ඔහු කීය.[15]

ශෙලී පවසන ඉතාමත් අරුත්බර ප්‍රකාශය නම් පරිකල්පනය ම සදාචාරකාරකයකි යන්නයි. කාව්‍යය සිය කාර්යය ඉටු කරනුයේ පාඨකයන් විසින් අනුකරණය කළ යුතු ගුණ සහිත චරිත විස්තර කිරීම මෙන් නො ව සෑම මිනිසෙකු තුළ ම ඇති පරිකල්පන ශක්තිය පෝෂණය හා ශක්තිමත් කිරීම ද මගිනි.

සදචාරය තුළ සැඟවුණු ප්‍රධාන රසය ආදරයයි; නැතහොත් අපගෙන් වෙන් ව ගොස් අපගේ නො වන චින්තා, ක්‍රියා හෝ

පෞරුෂයන් සමඟ අනන්‍ය වීමයි. මිනිසෙකු බෙහෙවන් සාධුතර වීමට ඔහු අධික ලෙසත්, පුළුල් ලෙසත් පරිකල්පනය කළ යුතු යි; තවත් පුද්ගලයෙකු සිටින තත්ත්වයට පත් විය යුතු යි; වෙනත් අයගේ තත්ත්වයට පත් විය යුතුයි; ඔහුගේ වර්ගයා විඳින වේදනාව, සන්තෝෂය ඔහු ද විඳින වේදනාව හෝ සන්තෝෂය බවට පත් විය යුතුය. සදාචාරයේ විශිෂ්ට මෙවලම පරිල්පනයයි. කාව්‍යය හේතුව මත ක්‍රියාකාරී වීමෙන් ඵලය පාලනය කරයි; කාව්‍යය පරිකල්පනයේ වෂය පථය පුළුල් කරයි; කිසි ද නො විඳි ස්වරූපයේ සිතුවිලි මගින් පරිකල්පනයේ අඩුපාඩු පුරවාලයි. අනෙක් සිතුවිලි සියල්ල මේ සිතුවිලිවල ස්වභාවයට සරිල පරිදි මේවායින් ආකර්ෂණය කොට උරා ගත හැකි ශක්තියක් ඒ තුළ වෙයි. මේ සිතුවිලිවල අලුතෙන් අවකාශ ඇති වුණු අතර ඒවා පිරවීම් වස් ඒවාට ආහාර අවශ්‍ය වෙයි. මිනිස් සිරුරේ ඇති අවයවයක් ව්‍යායාම මගින් ශක්තිමත් වන්නේ යම් සේ ද එසේ ම මිනිසාගේ සදාචාරය නමැති අවයවය ශක්ති සම්පන්න වනුයේ කාව්‍යය නමැති ව්‍යායාමය මගිනි.[16]

මෙය කාව්‍යය සදාචාරයට කරන බලපෑම ප්‍රමාණවත් අයුරින් ඔප්පු කෙරෙන්නක් ලෙස හැඟෙයි. කාව්‍යය අපගේ ප්‍රතිභාව, පරිකල්පන ශක්තිය තිර කොට පුළුල් කරන බව පවසන අභිනවගුප්තයන්ගේ ප්‍රකාශය ශෙලීගේ මතය තහවුරු කරන්නකි. මනුෂ්‍ය ජීවිතයේ සංයුක්ත අවස්ථාවන්ගේ සංකීර්ණත්වය පිළිබඳ අන්තර් දෘෂ්ටියකින් තොර වූ තැන සදාචාරයක් ඇති විය නො හැකිය. අනිත් අය ලබන සැබෑ අත්දැකීම් උකහා ගැනීම මගින් සිය ආත්මය වඩවඩාත් පෝෂණය කරගැනීමෙහි ලා මිනිසුන් දක්වනුයේ බලවත් ආශාවකි. ආධ්‍යාත්මික අවබෝධය ලැබීම මනුෂ්‍යත්වයට සම්බන්ධ විවිධ විචිත්‍ර අත්දැකීම් හසු කරගැනීමට අප තුළ පවත්නා දක්ෂතා මත රඳා පවතී. අනෙකෙකු ලැබූ අත්දැකීම අපගේ ආත්මයට හසු කර ගෙන එයට යළිත් පණ දීම තුළින් ද අපගේ පරිකල්පන ශක්තිය තර කිරීම තුළින් ද කාව්‍යය අපගේ සදාචාර ජීවිතයේ සංකීර්ණත්වය කෙරෙහි අප තුළ තීක්ෂණ අන්තර් දෘෂ්ටියක් ඇති කරයි.

## කාව්‍යය හා සදාචාර ක්‍රියා

කාව්‍යය මානව ක්‍රියාවට බලපෑමක් කරයි ද? මීට සරල පිළිතුරක් නැති බව පෙනී යයි. ඇතැම් විචාරකයන්ගේ විශ්වාසයට අනුව කාව්‍යය මිනිසාගේ ක්‍රියා කලාපය කෙරෙහි යහපත් බලපෑමක් විහිදුවයි. ය්වෝර් වින්ටර්ස් කාව්‍යය අපගේ බුද්ධිය හා සදාචාරාත්මක මානසික ස්වභාවය තර කරති'යි සිතයි. "මෙකී ප්‍රතිඵල ස්වාභාවික ව ම අපගේ ක්‍රියාවන්ට බලපෑ හැකි නම් නිත්‍ය ශික්ෂණය මෙන් ඒවා ස්ථිර ව ම අපගේ පෞරුෂය තුළට වදී.[17] කාව්‍යය මනුෂ්‍ය ක්‍රියාවලියට මඟ හැරිය නො



හැකි අන්දමේ බලපෑමක් කරන බව එල්ඩර් ඕල්සන්ගේ ද විශ්වාසයයි.[18] එවැන්නක් ඒකාන්ත වශයෙන් ම ස්ථිර ව පිළිගැනීමට ඓතිහාසික හා සමකාලීන සාක්ෂි ඇති බවක් නො පෙනේ. බොහෝ කවීන් හා කලාකරුවන් සදාචාර නීති පමණක් නො ව මනුෂ්‍යත්වයේ ආවශ්‍යක මූලධර්ම පවා කැඩීම තුළින් අපකීර්තිය හිමි කරගෙන තිබේ. තමන්ට ම ආවේණික වූ කල්පනා ලොවක දැඩි ව නිමග්න වී සිටින බැවින් ඔවුන්ට ස්වකීය සමාජයේ සාමාජිකයන් කෙරෙහි වන සදාචාර යුතුකම් ගැන මතකයක් ඇති ව සිටීමට ඉඩක් නැති බව යමෙකු මෙහි ඔවුන් බේරීම සඳහා කීමට ඉඩ තිබේ. කාව්‍යයේ නිර්මාතෘවරුන් සදාචාර පරිසමාප්තියේ මාහැඟි සංකේත බවට පත් නො වෙත් නම් පාඨකයා කාව්‍යයෙන් ලබාගන්නා සදාචාර පණිවුඩය සිය තියුණු බුද්ධිය මෙහෙයවා ක්‍රියාවට නගති'යි අපේක්ෂා කළ නො හැකිය. මෙය සැබවින් ම කළ හැක්කක් නම් මේ වන විට මුළු ලොව ම එක ම දෙව්ලොවක් බවට පත් නො වන්නට හේතු නැත.

මිනිසා ජීවත් වන්නේ කවියෙන් පමණක් නො වේ. ඔහුගේ ජීවිතයේ කවර ම අවස්ථාවක් වුවත් ගෙන බැලුවොත්, ඔහුගේ සහජ ප්‍රේරණ සමාජ දේශපාලනික මත, විවිධ ඕනෑඑපාකම් පිළිබඳ ව දක්වන සැලකිල්ල මෙන් ම පරිසරයට සම්බන්ධ නිමක් නැති තවත් සාධක ද ඔහුගේ කාර්යයට බලපායි. මිනිස් කටයුතුවල දී කාව්‍යයට එතරම් කැපී නො පෙනෙන වැඩ කොටසක් පැවරීම කාව්‍යයේ අගය ඌන තක්සේරු කිරීමක් නො වේ. මිනිසා කරන ක්‍රියා සදාචාරවත් කිරීම සඳහා ඔහුගේ පෞරුෂයට කිසි යම් බලපෑමක් කරයි යන අරුතින් කාව්‍යය ඔහු කෙරෙහි යහපත් බලපෑමක් සැබවින් ම කරයි. එහෙත් කාව්‍යය මිනිස් ජීවිතයට කරන මේ බලපෑම ක්‍රියාශීලී සැබෑ ජීවිතයේ දී සඵල වන්නේ ද යන්න සංකීර්ණ සාධක රාශියක් මත රඳා පවතී. සී.ඊ.එම්. ජෝඩ් මෙසේ කියයි. "සාරධර්ම ඒවා අනුගමනය කරන සේ අප පොලඹවයි. එහෙත් මේ පෙලඹවීම කිසි විටෙකත් බල කිරීමක් නොවේ. අපි පොලඹවනු ලබමු. ඒ විනා අපට බල නො කැරෙයි."[19]

උපතේ දී ම මිනිසෙකු සතු ව පෞරුෂයක් නැත. ඒ මොහොතේ ඔහු සතු ව ඇත්තේ සැඟවුණු ශක්ති සමුදායක් පමණි. ඔහු සතු ඇතැම් සැඟවුණු ශක්තීන් සැබවින් ක්‍රියාවට නැංවීමට කාව්‍යය ඔහුට උපකාර වන අතර ඔහුගේ බුද්ධිය ද නිසි මගට යොමු කරවයි. එහෙත් කාව්‍යය පරිශීලනය කරන පාඨකයා සෑම අංශයකින් ම සදාචාරය අතින් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු වන බවට මෙය සහතිකයක් නො වේ.

කාව්‍යය මිනිසාගේ ක්‍රියා කලාපය අවශ්‍යයෙන් ම යහපත් අතර නො හරවන්නේ නම් කාව්‍යය කවර ආකාරයකින් සදාචාරාත්මකය යි කියමු ද? සමාජයේ කාර්යක්ෂම පරිණාමය හා පුද්ගලයාගේ

ආත්මපූර්ණත්වය සඳහා මිනිසා තම ප්‍රේරණ හා අවශ්‍යතා සංවිධානය කිරීම සඳහා දරන වෑයම සදාචාරය ලෙස හැඳින්විය හැකිය. සදාචාරයේ අවශ්‍යතාව පැන නගින්නේ පුද්ගලයා තුළ මෙන් ම සමාජය තුළ ද යන මේ දෙ තැන ම පවත්නා එකිනෙකට පටහැනි අවශ්‍යතාවන්ගෙනි. පුද්ගලයා සිය අවශ්‍යතා ඉටු කරගැනීමට අපොහොසත් වූ කල්හි ඔහු තුළ සියලු ආකාරයේ විවිධ මනෝ විකාර හටගනී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ පෞරුෂය විකෘත වෙයි; ඉන්ද්‍රිය ශක්තීන්ගේ වැඩීම ඇනහිටී. සමාජයක් තුළ ම එකමුතු ව සංස්ථාපනය කිරීමට නො හැකි වූ කල්හි විරෝධය හා අවුල් වයවුල් අනවරතයෙන් ඇති වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පෙරළා පුද්ගලයන්ගේ කරදර ද තව තවත් උග්‍ර වෙයි. කෙසේ වුවත් පුද්ගලයා හා සමාජය අතර සදාකාලික සමතුලිතතාවන් ගොඩනැඟීම කළ නො හැක්කක් බව ද අප මතක තබාගත යුතු ය.

පුද්ගලයාට හා සමාජයට ද බොහෝ විට අලුත් අලුත් තත්ත්වයන්ට මුහුණ පෑමට සිදු වන අතර මෙහි දී අවස්ථානුරූප ව සමාජයටත් පුද්ගලයාටත් නැවත සීරුමාරු වීමට සිදු වෙයි. මෙකී වෙනස් වන අවස්ථා ඉදිරිපත් වීමත් සමඟ අපගේ සදාචාර හැඟීමට අභියෝග එල්ල වන අතර හැඟීමේ ශක්තිය උරගා බැලීමට ඉන් අපට අවස්ථාව සැලසේ. කලාව අපගේ සද්චරිතය වඩාත් අනභිභවනීය හා චිරස්ථායි කිරීමට ද හේතු වන හෙයින් එහි ඉමහත් අගය මතු වන්නේ මෙහි දී ය. පාඨකයාගේ යුගයට ආවේණික සදාචාරාත්මක විඤ්ඤාණය හැඩගැස්වීමෙහි ලා ඔහු තුළ ඇති වගකීම පිළිබඳ ව ඔහු දැනුවත් කරනුයේ කලාව යි. වත්මන් පරිහානි යුගයෙහි ලේඛකයන් සමාජය ඇමතීම ප්‍රතික්ෂේප කරන වර්තමාන පරිහානි යුගයෙහි කොලිංවුඩ්ගේ වදන් යළි යළිත් සිහි කිරීම මැනවයි හැඟේ. "කලාකරුවා සිය කලා කර්තව්‍යය කිරීමට භාර ගනුයේ එය තමන්ට අයත් පෞද්ගලික කටයුත්තක් ලෙස නො වේ. ඔහු ද අයත් වන සමාජය වෙනුවෙන් ඔහු වෙත පැවරුණු පොදු කටයුත්තක් ලෙසිනි."[20] කවියා ලවා අනාගත වක්තෘවරයෙකුට භාර කාර්යය කරවීමට කොලිංවුඩ්ට අවශ්‍ය ව ඇත. එහෙත් මෙහි අරුත නම් කවියා අනාගතයේ සිදුවීමට තිබෙන දේ ගැන අනාවැකි කිව යුතු බවක් නො වේ. එහි අරුත නම් කවියා "සිය ශ්‍රාවකයන් තමා හා උරණ වුවත් ඒ සියලු අවදනම් නො තකා ඔවුන් සියල්ලන්ගේ හදවත්වල මුළුගැන්වුණු රහස් සියල්ලක් ම ඔවුන්ට හෙළිදරව කළ යුතු" බවයි. ඔහු නො වළහා නිර්භය ව කතා කළ යුතුය. අංග සම්පූර්ණ පාපෝච්චාරණයක් කළ යුතුය.[21] ඔහු මෙසේ ද සිතයි. " කලාව සමාජයේ මනසේ නරක ම රෝගය වන විඤ්ඤාණ දූෂණයට හොඳ ම ඖෂධය"යි.[22]



කවියෙකු කරනුයේ මිනිසා තුළ පවත්නා මනෝභාවයන් හා ආකල්ප අතර පවත්නා අන්තර් ක්‍රියාවන් නියත වූත්, විෂය මූලික වූත්, විශ්ව සාධාරණ වූත් ක්‍රමයකට ක්‍රමවත් ව අපට කියා දීමයි. "නො වළහා කථා කිරීම" මගින් ඔහු "විඤ්ඤාණ දූෂණය" මේ යැයි අපට පෙන්වා දෙයි. එමෙන් ම එය තවදුරටත් දූෂණය වීමට ඇති හැකියාව ගැන ද ඔහු අපට අනතුරු හඟවයි.

සෑම සමාජයක් ම තමාට අයත් සදාචාර සාරධර්ම පද්ධතිය විකාසනය කර ගෙන ඇත්තේය. එහෙත් මෙකී විවිධ පද්ධතීන් සියල්ල වලංගු වන ආකාරය එක සමානය. එනම් විශ්වව්‍යාපී අවශ්‍යතාවක් වන මිනිසාගේ මූලික ධර්මය සාක්ෂාත් කරගැනීම හා මිනිසා සතු ලෞකික හා ලෝකෝත්තර විභවයන් සම්පූර්ණ වසයෙන් ක්‍රියාවට නැඟීමයි. පුද්ගලයන් උපත ලබනුයේ මේ සදාචාර හැඟීම ඇති ව නොවේ. එය පුද්ගලයා සතු සහජයක් නො වේ. සදාචාර දහම් ඔහු තුළ කාවද්දනුයේ සමාජ පරිසරය විසිනි. උපතේ සිට වැඩී එන කාලය තුළ සිදු වන ක්‍රියාවලිය තුළින් අප නතු කරගන්නා සදාචාර හැඟීම නිසැක ව ම අපගේ කාව්‍යමය අනුභූතිය තුළ කාර්යභාරයක් ඉටු කරයි. එක්තරා ප්‍රමාණයකට දීර්ඝ වූ සෑම කාව්‍යයක් තුළ ම කවියා අර්ථවත් සදාචාරාත්මක උභතෝකෝටිකයන්ට මුහුණ පෑ මිනිසුන් නිරූපණය කළ යුතුයි. ශෝකාන්තයන්හි දක්නට ලැබෙන ඝට්ටනය නිසැක වශයෙන් ම චරිතයක් සදාචාර නීති උල්ලංඝනය කිරීම නිසා හටගනී. සදාචාර ධර්ම පිළිබඳ දැනුම හා සානුකම්ප අවබෝධය කාව්‍යමය අනුභූතිය ලැබීමේ දී අවශ්‍ය වේ. නිදසුන් ලෙස තමාගේ ආගන්තුක සත්කාර ලැබීමට තමා කරා පැමිණි ගරු කළ යුතු, අහිංසක මහලු මිනිසෙකු කුරිරු අන්දමින් මරණයට පත් කිරීම විභේද ක්‍රියාවක් ලෙස විශ්වාස කරන මිනිසෙකු තුළ මැක්බත් නාටකයේ එන ඛේදජනක අවස්ථාව අනුකම්පාවක් ඇති වීමට අවකාශ නැත. කාව්‍යමය ප්‍රතිචාරයට සදාචාර හැඟීම අවශ්‍ය වන්නේ නම්, සදාචාර හැඟීම ද කාව්‍යමය ප්‍රතිචාරයෙන් පෙරළා ශක්තිමත් වෙයි. කවියෙකු හුදෙක් කරනුයේ අප තුළ මේ වන විටත් පැළපදියම් වී තිබෙන සදාචාර හැඟීම තවදුරටත් තහවුරු කිරීම හෝ සදාචාර බිඳීම් නිදර්ශිත කිරීම යැයි යන්න මෙහි දී අප තර්ක කරන දෙය නො වේ. සුධීමත් මහා කවියෙකු සිය කාව්‍යය තුළින් හැඟීම් හා ක්‍රියා ඇගයීම් වස් නව මගක් සකස් කිරීමට ඇතැම් විට ඉඩ තිබේ. සදාචාරය යනු සාම්ප්‍රදයික සදාචාර හා චර්යා පද්ධතිය නො වේ. සදාචාරය යනු අප පිට පටවන ලද දැඩි තහංචි හෝ කටුක නියම නො වේ. දණ්ඩ නීති සංග්‍රහය සකස් කරන්නන්ගේ හා ඉරු දින පාසැල් ගුරුවරුන්ගේ ද ඒකාධිපත්‍යය උසුලන ලෝකය දෙස කාව්‍යය හෙළනුයේ උදාසීන බැල්මකි. කාව්‍යයේ අරමුණ වනුයේ මිනිසා මුහුණ පාන සංකීර්ණ දුෂ්කරතාවන් පිළිබඳ ව

අපගේ දැනුම වඩාත් පුළුල් කිරීමත්, අපගේ ජීව ශක්තිය වඩාත් බලවත් කිරීමත්ය. ජීව ශක්තිය බලවත් කිරීම මාර්ග දෙකකින් සිදු වේ. හොඳ කාව්‍යයක් රසාස්වාදනය සඳහා දැඩි ලෙස එකඟ කළ සිතක් අවශ්‍ය වෙයි. අප සතු බුද්ධිමත් හා භාවමය මහිමයන් අධිකතර ව වෙහෙසට පත් කර එකමුතු කළ යුතුය. මේ මගින් අප තුළ ඇති සූක්ෂ්මාත්මතාව වඩාත් ආඪ්‍ය වන අතර වඩාත් හොඳින් හා පැහැදිලි ව දැකීමටත් හැඟීමටත් අපට ඉන් ඉඩ සැලසෙයි. තව ද දැඩි කොට ශක්තිමත් කළ ජීව ශක්තිය අපගේ අභේද්‍යත්වයේ ප්‍රතිඵලයකි. හික්මවිය නො හැකි, ආකූල ව්‍යාකූල මානව අත්දැකීම් කාව්‍යාස්වාදය ලබන අතර ශික්ෂණයට හසු කිරීමෙනි ඒ අභේද්‍යත්වය ලබන්නේ. කාව්‍යයට ප්‍රතිචාර දක්වීමේ දී අප ලබන අසාමාන්‍ය චමත්කාරය අපගේ ඒ ජීව ශක්තිය අප කරා එළඹී බවට සලකුණ මෙන් ම එහි පරමාර්ථය ද වන්නේය.

## පාදක සටහන්

1. භරත, නාට්‍යශාස්ත්‍ර, එම්.ආර්. කවි සංස්කරණය 1956, 1. 108.
2. එම, පි. 282.
3. එම, පි. 640.
4. එම, පි. 4.
5. එම, පි. 10.
6. ආනන්දවර්ධන, ධ්වන්‍යාලෝක, පත්තාභිරාම ශාස්ත්‍රි සංස්කරණය, 1940, පි. 190.
7. එම, පි. 336.
8. Theory of Literature, London 1954, p. 21.
9. P.B. Shelley, "A Defence of Poetry", English Literary Criticism, ed, C.E. Vaughan, London n.d., p. 164.
10 එම, පි. 161.
11. එම, පි. 165.
12. එම, පි. 199.
13. එම, පි. 169.
14. එම, පි. 170.
15. එම, පි. 186.
16. එම, පි. 171-172.
17. Yvor Winters, In Defence of Reason, New York 1947, p. 22.
18. Elder Olson, "A Outline of Poetic Theory" in Critics and Criticism, ed. R.S. Crane, Chicago 1952, p. 23.
19. C.E.M. Joad, Guide to Modern Wickedness, London 1948, p. 33.
20. R.G. Collingwood, The Principles of Art, Oxford 1950, p. 315.
21. එම, පි. 336.
22. එම, පි. 336.

# පිළිසඳර

**බුවනෙක*** :

ඔබ දැන් කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ ජ්‍යෙෂ්ඨතම මහාචාර්යවරයා මෙන් ම විෂ්‍රුපක මහාචාර්යවරයා (Chair Professor). ආචාර්යවරයකු වශයෙන් ඊළඟ පියවර කුමක් ද?

**කුමාරසිංහ** :

මා විශ්වවිද්‍යාල ආචාර්යවරයකු වශයෙන් අද සිටින්නෙ කෙනෙකුට ලබාගත හැකි - ළඟා විය හැකි ඉහළ ම ශ්‍රේණියේ. තවදුරටත් ලබාගත හැකි උසස් වීමක් හෝ තනතුරක් නෑ. මා මුලින් ම සිංහල අංශයට බැඳුණේ තාවකාලික කථිකාචාර්යවරයකු ලෙස. ඒ 1974 අප්‍රේල් මාසයේ 04 ද. අධ්‍යයන අංශයේ පුරප්පාඩු නොතිබුණු නිසා අවුරුදු හතරක් ම එම තනතුරේ සිටින්න සිදු වුණා. ඉන් පසු 1978 ජූලි මස 26 ද ආධුනික සහකාර කථිකාචාර්යවරයකු ලෙස ස්ථිර තනතුරට තෝරාගනු ලැබුවා. 1984 දක්වා එම තනතුරේ සිටීමට සිදු වුණා. මේ කාලය තුළ මා ඉගැන්වීමේ කටයුතුවලට අමතරව සම්පූර්ණ කාලය ගත කරනු ලැබූයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා. ආචාර්ය උපාධිය ලබාගැනීමෙන් පසු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 වන ශ්‍රේණියට උසස් කරනු ලැබුවා. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයකුගේ ආධුනික පරිවාස කාලය අවුරුදු 08 ක් වෙනවා. මේ කාලය තුළ පශ්චාත් උපාධියක් ලබාගත නොහැකි වුව හොත් තනතුරෙන් පහකරනු ලබනවා. 1990 වර්ෂයේ දී මා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණියට උස් කරනු ලැබෙනවා. 1992 පමණ වන විට ප්‍රමාණවත් තරම් පර්යේෂණාත්මක පොතපත හා ලිපි ලේඛන පළ කර තිබූ නිසා මා සහාය මහාචාර්ය තනතුරට ඉල්ලුම් කරනු ලැබුවා. එකල අද මෙන් එක් වරට ම මහාචාර්ය තනතුරට පත්වන්නට බැහැ. මුලින් ම සහාය මහාචාර්ය තනතුරට ඉල්ලුම් කර එය ලබාගන්න ඕන. ඒ අනුව 1992 දී මට සහාය මහාචාර්ය තනතුර ප්‍රදානය කෙරුණා. ඉන්පසු ඊළඟ තනතුර වූ මහාචාර්ය තනතුර ලබාගැනීම සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතුවල යෙදී සහාය මහාචාර්ය තනතුරේ අවුරුදු 05 ක් පමණ අඛණ්ඩ ව සේවය කිරීමෙන් පසු ඒ කාලය තුළ සිදු කරන ලද පර්යේෂණ මත 1997 දී මහාචාර්ය තනතුරට ඉල්ලුම් කළ අතර ඒ තනතුරට ප්‍රමාණවත් තරම් සුදුසුකම් තිබුණු හෙයින් එය මට ලබාගත හැකි වුණා. පොත්පත් හා ලිපිලේඛන පළ කිරීම හා පර්යේෂණ කටයුතුවල අඛණ්ඩව නිරත වූ නිසා වර්ෂ 2002 වසරේ දී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර සඳහා ඉල්ලුම් කළ හැකි වුණා. එකල ක්‍රියාත්මක වූ නීතිරීතිවලට අනුව, සහාය මහාචාර්ය වශයෙන් අවුරුදු 05 ක් ද මහාචාර්ය වශයෙන් අවුරුදු 05 ක් ද මා සේවය කොට තිබුණා. මේ කාලය තුළත් පර්යේෂණ කාර්යය දිගට ම කරගෙන ගියා. 2002 නොවැම්බර් මාසයේ දී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර

* නයිජීරියාවේ ජාතික විශ්වවිද්‍යාලයේ මහාචාර්ය බුවනෙක විජේරත්න ය.